# භික්ෂු උවටැන නිවන තෙක් දුගතියේ දොර වසයි

## සඞ්ඝුපට්ඨාක ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 328 - 329)

වෙස්සභූ බුදු රජාණන් වහන්සේගේ කාලයේ ආරාමයක උපස්ථායකයෙක් විය. ඔහු ඉතා සතුටින් පැහැදුණු සිත් ඇති ව භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කළා.

එහි ආනිසංස ලෙස කල්ප තිස්එකක් සුගතියේ සැප ලැබුවා. සක්විති රජකම ද ලැබුවා. අප බුදු රජාණන් වහන්සේගේ ශාසනයේ පැවිදි ව සසර ගමන නිමා කළා.